**සී/ස ජාතික ලුණු සමාගම - 2024/2025**

**------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ලුණු සමාගමේ (“සමාගම”) 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (SMEs සඳහා SLFRS) 17.2 ඡේදයට අනුව, දේපළ පිරියත සහ උපකරණ (PPE) භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය හෝ සැපයීම සඳහා භාවිතා කිරීමට, අන් අයට කුලියට දීමට හෝ පරිපාලන අරමුණු සඳහා තබා ඇති ස්පෘශ්‍ය අයිතම වලින් සමන්විත විය යුතුය. කෙසේ වුවද, වියදමක් ලෙස හඳුනාගත යුතු අලිමංකඩ ලුණු ලේවායේ මේස ලුණු යන්ත්‍රාගාරය සඳහා විදුලි සම්බන්ධතාවයක් ලබා ගැනීම වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට කරන ලද රු.7,101,431 ක ගෙවීමක් දේපළ පිරියත සහ උපකරණ යටතේ වැරදි ලෙස වර්ගීකරණය කර තිබුණි. | "තොග සැපයුම" කාණ්ඩය යටතේ මේස ලුණු යන්ත්‍රාගාරය (TSP) සඳහා විදුලිය සැපයීමට අදාළ සියලු වියදම් සටහන් කර ඇත. මේස ලුණු යන්ත්‍රාගාරය වෙත ස්ථාවර සහ වෙන් වූ බල සැපයුමක් තහවුරු කිරීම සඳහා ආයතන පරිශ්‍රය තුළ වෙනම ට්‍රාන්ස්ෆෝමරයක් ස්ථාපනය කරන ලදී. මේස ලුණු යන්ත්‍රාගාරය යටතේ එය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු යොදා ඇත. | භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය හෝ සැපයුම සඳහා භාවිතා කිරීමට, අන් අයට කුලියට දීමට හෝ පරිපාලනමය අරමුණු සඳහා යොදවාගනු ලබන ස්පෘශ්‍ය අයිතම පමණක් දේපළ, පිරියත සහ උපකරණ යටතේ හඳුනා ගත යුතුය. |
| (ආ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (SMEs සඳහා SLFRS) 13.4 ඡේදයට අනුව තොගය එහි පිරිවැය සහ ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන් විකිණීම සඳහා දරන ලද පිරිවැය අඩුකල පසු අගය යන දෙකෙන් අඩු අගය මත මැනිය යුතුය. කෙසේ වුවද, ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමෙන් තොරව රු. 125,865,255 ක් වූ අවසන් තොගය පිරිවැයට අගය කර තිබුණි. | ශුද්ධ උපලබ්ධි අගය (NRV) සෑම විටම පිරිවැයට වඩා වැඩිය. | තොගය එහි පිරිවැය සහ ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන් විකිණීම සඳහා දරන ලද පිරිවැය අඩුකල පසු අගය යන දෙකෙන් අඩු අගය මත මැනිය යුතුය. |
| (ඇ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ | 2025/26 මූල්‍ය වර්ෂයේ සිට මෙම තොරතුරු වෙන වෙනම | ප්‍රමිතියට අනුව හෙළිදරව් |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමිතියේ (SMEs සඳහා SLFRS) 33.7 ඡේදයට අනුව, ප්‍රධාන කළමනාකරණ තනතුරු දරන නිලධාරීන් සඳහා කරනු ලබන ගෙවීම් හෙළිදරව් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එවැනි හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. | හෙළිදරව් කිරිමට අවශ්‍ය කටයුතු යොදා ඇත. | කිරීම් සිදු කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.5.3 අනුව, සමාලෝචිත වර්ෂයේ සිට රු. 47,021,868 ක කෙරීගෙන යන වැඩ හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද, 2025 මාර්තු 31 දිනට කෙරීගෙන යන වැඩ ශේෂයේ සැබෑ පිරිවැය හඳුනා ගැනීම වෙනුවට පසුගිය මාස තුන තුළ දරන ලද නිෂ්පාදන පිරිවැය අවසන් කෙරීගෙන යන වැඩ ශේෂය වශයෙන් හඳුනාගෙන තිබුණි. තවද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (SMEs සඳහා SLFRS) 10.14 ඡේදය ප්‍රකාරව කෙරීගෙන යන වැඩ හඳුනා ගැනීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2024/25 මූල්‍ය වර්ෂයේ සිට සමාගම විසින් කෙරීගෙන යන වැඩ (WIP) හඳුනාගැනීම සිදු කරනු ලබයි. අදාළ දිනය දක්වා දරන ලද සියලු වියදම් අදාළ අස්වනු නෙළන කාලය සඳහා කෙරීගෙන යන වැඩ වශයෙන් සුදුසු ලෙස හඳුනාගෙන ඇත. අස්වැන්න නෙළීම අවසන් වූ පසු, අදාළ වියදම් ක්‍රමානුකූලව කෙරීගෙන යන වැඩ වෙතින් නිෂ්පාදන පිරිවැයට මාරු කරනු ලබන අතර, අදාළ ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව ආදායම සමඟ පිරිවැය නිවැරදිව ගැලපීම සහතික කෙරේ. පාත්තිවල ඉතිරිව ඇති ලූණු කෙරීගෙන යන වැඩ ලෙස හඳුනා ගැනීම සහ අස්වනු නෙළන අවස්ථාවේ අදාළ පිරිවැය නිෂ්පාදන පිරිවැයට ඇතුළත් කිරීම වඩාත් සුදුසුය. | වසර අවසානයේ නොනිමි තොගයේ සත්‍ය පිරිවැය, අවසන් කෙරීගෙන යන වැඩ ශේෂය ලෙස හඳුනාගත යුතු අතර, ප්‍රමිතියට අනුව අදාළ හෙළිදරව්කිරීම් සිදු කළ යුතුය. |
| (ඉ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි (SMEs සඳහා SLFRS) 10.21 ඡේදය ප්‍රකාරව පෙර කාලපරිච්ඡේද දෝෂ නිවැරදි කිරීමේදී සංසන්දනාත්මක අගයයන් නැවත ප්‍රකාශ කළ යුතු වුවද ඊට පටහැනිව සංසන්දනාත්මක අගයයන්` නැවත ප්‍රකාශ නොකර රු.3,878,937 ක ගැලපීම් සිදු කර තිබුණු අතර එය ප්‍රමිතියේ 10.23 ඡේදයට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර කර නොතිබුණි. | පෙර මූල්‍ය වර්ෂයට අදාලව සිදු කරන ලද ගැලපීම්වලට අදාළ සියලු අවශ්‍ය හෙළිදරව් කිරීම් ඉදිරි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සුදුසු පරිදි සිදු කරනු ලැබේ. | පෙර කාලපරිච්ඡේද දෝෂ නිවැරදි කිරීමේදී, සංසන්දනාත්මක අගයයන් නැවත ප්‍රකාශ කළ යුතු අතර ප්‍රමිතියට අනුව හෙළිදරව් කිරීම් සිදු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරන ලද අනුපාතයෙන් බැහැර අනුපාතයක් භාවිතා කරමින් යන්ත්‍රෝපකරණ හා ජල පොම්ප, පරිගණක උපකරණ සහ ගෘහ භාණ්ඩවල ක්ෂයවීම් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය වියදම රු. 4,139,486 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සටහන 02 යටතේ වැරදි ක්ෂය අනුපාතයක් ඉදිරිපත් කර ඇත. නිවැරදි ක්ෂය අනුපාතය ක්ෂය උපලේඛණයේ සටහන් කර ඇති අතර, දෝෂය සටහනේ සිදු කරන ලද හෙළිදරව් කිරීම් වලට පමණක් සීමා විය. | නිවැරදි අනුපාත භාවිතා කර ක්ෂය ගණනය කිරීම හා ගැලපීම කළ යුතුය. |
| (ආ) | අලිමංකඩ ලුණු ලේවායේ මේස ලුණු යන්ත්‍රාගාරය සඳහා ගොඩනැගිල්ල 2024 අගෝස්තු 16 වන දින නිම කර සමාගමට භාර දී තිබුණි. කෙසේ වුවද, 2025 මාර්තු 31 දිනට ගොඩනැගිල්ලේ පිරිවැය රු. 131,587,112 ක් වූ අතර එය කෙරීගෙන යන වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එබැවින්, ඒ මත ක්ෂය සහ සමුච්චිත ක්ෂය රු. 4,091,818 කින් අඩුවෙන් දක්වා තිබූ අතර වර්ෂය සඳහා ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | අදාළ ක්‍රියා පටිපාටිවලට අනුකූලව සියලුම කටයුතු නිසි ලෙස සිදු කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය උපදෙස් නිකුත් කර ඇත. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීම හා ක්ෂය කිරීම කළ යුතුය. |
| (ඇ) | බදු ගිවිසුම විගණනයට ඉදිරිපත් කර නොතිබූ බැවින්, රු.42,900,000 ක් වූ මන්නාරමේ පිහිටි බදු පදනමින් ලබාගත් කර්මාන්තශාලා ඉඩමේ පිරිවැය සහ බදු කාලය විගණනයට තහවුරු නොවීය. | 2001 වර්ෂයේදී ඉඩම දිගුකාලීන බදු පදනම මත මන්තායි ලුණු සමාගමට (උතුරු පළාතේ ලුණු ලේවායයන්) පැවරූ අතර, ඉඩමේ අයිතිය රජය සතුව පැවතුණි. ඒ අනුව, සමාගමේ ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉඩම් වටිනාකම ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | බදු ගිවිසුම සහ අදාළ ලියවිලි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | වාර්ෂික තොග සත්‍යාපන වාර්තා නොමැති වීම හේතුවෙන් තොග යටතේ දක්වා තිබූ රු.47,592,824 ක පිරිවැයක් සහිත පරිභෝජන තොගවල පැවැත්ම තහවුරු නොවීය. තවද, 2025 මාර්තු 31 දින වන විට පරිභෝජන තොගවල ඇතුළත් රු.5,152,652 ක් වූ වෙනත් තොගවල පැවැත්ම | මූල්‍ය වර්ෂය අවසානයේදී, වත්කම් පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙම ක්‍රියාවලිය අතරතුර, සියලුම ස්ථාවර වත්කම් සහ ඉන්වෙන්ටරි අයිතම හඳුනා ගන්නා ලදී. රු.5,152,652 ක් වන අනෙකුත් ඉන්වෙන්ටරි 2022/23 මූල්‍ය වර්ෂය අවසානයේ සිදු කරන | වාර්ෂික තොග සත්‍යාපනය සහ තොග ලෙජරය මගින් තොගවල පැවැත්ම තහවුරු කළ යුතුය. |

| | |
|---|---|
| වාර්ෂික තොග සත්‍යාපනය මගින් සහ තොග ලෙජරය මගින් තහවුරු නොවීය. | ලද භෞතික තොග වාර්තාවල ඇතුලත් නොවන ගැලපීමක් වන අතර අවසාන ගිණුම් හරහා මෙම අගය ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය | කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහිත මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2025 අගෝස්තු 05 වන දින මාස 02ක ප්‍රමාදයකින් යුතුව විගණනයට ඉදිරිපත් කර තිබූ අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නියමිත දිනට ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහිත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2020 ජනවාරි 27 දිනැති මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක PED 01/2020 හි 2 වන වගන්තිය, | චක්‍රලේඛයට අනුව, නව පත්වීම් ලෙස විධායක අධ්‍යක්ෂවරුන් පත් නොකල යුතු බව දක්වා තිබුණි. කෙසේ වුවද, 2023 අප්‍රේල් 11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගමට විධායක අධ්‍යක්ෂවරයෙකු බඳවා ගෙන තිබුණු අතර චක්‍රලේඛයට පටහැනිව 2024 අප්‍රේල් 01 සිට 2024 ඔක්තෝබර් 10 දක්වා කාලය තුළ අධ්‍යක්ෂ දීමනාව, දුරකථන දීමනාව සහ ඉන්ධන දීමනාව ලෙස රු. 713,925 ක මුදලක් ගෙවා තිබුණි. එම දීමනාවලට අමතරව වාහනයක් සහ රියදුරෙකු ලබා දී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. | සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ විධිමත් අනුමැතිය ඇතිව විධායක අධ්‍යක්ෂවරයෙකු පත් කරන ලදී. මෙම පත්වීම 2024 අවසානය දක්වා වලංගු වූ අතර, එම අවස්ථාවේ මණ්ඩලය විසුරුවා හැරීමෙන් පසු ස්වයංක්‍රීයව අවලංගු විය. 2025 ජනවාරි මාසයේදී නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරන ලද අතර, එහි සංයුතියට විධායක අධ්‍යක්ෂවරුන් ඇතුළත් කර නොමැත. | අධ්‍යක්ෂවරුන් බඳවා ගැනීමේදී චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 21 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 08/2022. | ලබා නොගත් නිවාඩු සඳහා සේවකයින්ට දීමනා ගෙවීමේදී, 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතට පටහැනිව | සමාගම එහි ආරම්භයේ සිටම නිවාඩු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන | චක්‍රලේඛයට පටහැනිව ගෙවන ලද දීමනා අයකර |

| | | | | |
|---|---|---|---|---|
| | | වර්ෂය තුල ලබා ගත හැකි නිවාඩු දින ගණන 21 වෙනුවට 42 ක් ලෙස සලකා තිබුණි. ඒ අනුව, චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 40 දෙනෙකුට නිවාඩු දීමනා ලෙස රු.500,785 ක මුදලක් ගෙවා තිබුණි. | අනුගමනය කරයි. එකතුව 42ක් වූ සමස්ත නිවාඩු සඳහා ගෙවීම් නොකරන අතර, ගෙවීම් කරනු ලබන්නේ සාප්පු සහ කාර්යාල පනතේ සීමාවට යටත් වෛද්‍ය නිවාඩු සඳහා උපරිම දින 10 ක් සහ විවේක නිවාඩු සඳහා දින 7 ක් දක්වා පමණි. මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ තීරණ ගනු ලැබුවේ මෙහෙයුම් අවශ්‍යතා සහ ශ්‍රම බලකායේ සහභාගීත්වය නිසි ලෙස සලකා බැලීමෙණි. | ගත යුතුය. |
| (ඇ) | 2024 පෙබරවාරි 28 දිනැති අංක PED 01/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ හි 3.1 වගන්තිය සහ 2022 අගෝස්තු 08 දිනැති අංක PED 04/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ හි 2.5 වගන්තිය. | මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සේවකයින් සඳහා නව දීමනා හෝ පවතින දීමනා සඳහා සංශෝධන හඳුන්වා නොදිය යුතුය. කෙසේ වුවද, මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ සභාපතිවරයාගේ නවාතැන් පහසුකම් සඳහා රු. 654,240 ක මුදලක් ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ විධිමත් අනුමැතිය ඇතිව, නිල භාවිතය සඳහා කොළඹ නගර සීමාව තුළ නවාතැන් පහසුකම් සැපයීමට තීරණය කරන ලද අතර ඒ ආශ්‍රිත වියදම් ප්‍රතිපූරණය කරන ලදී. කෙසේ වුවද, මෙම ප්‍රතිපූරණ ක්‍රියාමාර්ගය එතැන් සිට නතර කර ඇති බවත් දැනට එවැනි ගෙවීම් සිදු නොකරන බවත් දන්වමි. | චක්‍රලේඛයට පටහැනිව ගෙවන ලද දීමනා අයකර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.210,178,523 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.198,229,496 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.11,949,027 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට` මූල්‍ය ආදායම රු.35,118,727 කින් අඩුවීම, විකුණුම් සහ බෙදාහැරීමේ වියදම් රු.12,374,474 කින් වැඩිවීම සහ පරිපාලන වියදම් රු.30,791,524 කින් වැඩිවීමට එරෙහිව ලුණු අලෙවිය රු.94,775,837 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලුණු ලේවායන්හි සෘතුමය සේවකයින්ට සේවා කොන්දේසි (TOR) අඩංගු විධිමත් පත්වීම් ලිපියක්, හෝ රාජකාරි ලැයිස්තුවක් නිකුත් කර නොතිබුණි. එබැවින්, නීතිමය තත්වයන් යටතේ ඉටු කළ යුතු සේවා කොන්දේසි සහ රාජකාරි විෂය පථය තහවුරු කිරීමට නොහැකි වීමේ අවදානමක් පැවතුණි. | ස්ථිර පදනමින් පත් කරන ලද කම්කරුවන් සඳහා සමාගම රැකියා විස්තර ස්ථාපිත කර තිබුණි. කෙසේ වුවද, සෘතුමය සේවකයින් කාර්ය පදනම්ව සේවයේ යොදවන අතර නිශ්චිත කාර්ය සාධන ඉලක්ක සමඟ අනුගත වේ. සමාගම දෛනික වැටුප් තීරණය කිරීම සඳහා භාවිතා කරන ශ්‍රම ක්‍රියාකාරකම් සඳහා ප්‍රමිතිගත කාර්ය සහ ඉලක්ක දර්ශක පවත්වාගෙන යනු ලබයි. | ලුණු ලේවායන්හි සෘතුමය සේවකයින්ට ද සේවා කොන්දේසි (TOR) අඩංගු විධිමත් පත්වීම් ලිපියක් හෝ රාජකාරි ලැයිස්තුවක් නිකුත් කළ යුතුය. |
| (ආ) | විගණනය මගින් සිදු කරන ලද අලිමංකඩ ලුණු ලේවායේ භෞතික තොග පරීක්ෂාවට අනුව, 2024 පෙබරවාරි 28 වන දිනට භෞතික තොග ශේෂය සහ තොග වාර්තා ශේෂය අතර රු.13,548,600 ක වටිනාකමකින් යුතු මෙට්‍රික් ටොන් 408.4 ක (ආසන්න වශයෙන්) තොග විෂමතාවයක් නිරීක්ෂණය විය. කෙසේ වුවද, 2025 අගෝස්තු මාසයේ සිට ආරම්භ වන මාසික වාරික විසි අටක් (28) තුළ වගකිවයුතු නිලධාරීන් තිදෙනෙකුගෙන් (3) රු. 210,000 ක් පමණක් අයකර ගැනීමට පියවර ගෙන තිබුණි. | බාහිර මූලාශ්‍රවලින් කුලියට ගත් ට්‍රැක්ටරයක රැගෙන යා හැකි ධාරිතාව ප්‍රමිතියට අනුව ටොන් 4.6 ක් ලෙස මුලින් සටහන් වූ අතර, ට්‍රැක්ටර්වල වාර්තාගත ධාරිතාව සහ සත්‍ය මෙහෙයුම් ධාරිතාව අතර විෂමතාවයක් හඳුනා ගන්නා ලදී. ප්‍රවාහනයේදී අපේක්ෂිත ද්‍රව්‍ය පරිමාවන්හි ඌණතාවයට දායක වන ප්‍රධාන සාධකයක් ලෙස මෙම විෂමතාවය හඳුනාගෙන ඇත. වැටුප් අනුව සමාගමට සිදු වූ සත්‍ය අලාභය වගකිව යුතු අයගෙන් අය කර ගෙන ඇත. | තොග විෂමතා ප්‍රමාදයකින් තොරව වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ පිරිවිතරයන්ට අනුව, මෙස ලුණු යන්ත්‍රාගාරයෙහි පැයකට මෙට්‍රික් ටොන් 2.5 ක මුදාහැරීමේ අනුපාතයක් සහිත ග්‍රෑම් 400 ක සහ කිලෝග්‍රෑම් 1 ක පොලිතීන් ඇසුරුම් පද්ධති දෙකක් ඇතුළත් වන අතර කොන්ත්‍රාත්කරුගේ | මූලික සැලැස්මට අනුව, ස්වයංක්‍රීය ඇසුරුම් යන්ත්‍ර බිඳවැටීම් හෝ මන්දගාමී වීම් වලදී බාධාවකින් තොර හා අඛණ්ඩ ඇසුරුම් කිරීමක් සහතික කිරීම සඳහා මුද්‍රා තැබීමේ යන්ත්‍ර මිලදී ගන්නා ලද අතර එය | අවශ්‍යතාවය තක්සේරු කිරීමෙන් පසු වත්කම් මිලදී ගැනීම් සිදු කළ යුතුය. |

| | |
|---|---|
| කම්හල් පිරිවිතරයට අනුව පිරවුම් සහ ස්වයංක්‍රීය මුද්‍රා තැබීම් සහිත ස්වයංක්‍රීය ඇසුරුම් යන්ත්‍රයක් ද ඇතුළත් වේ. මෙම උපාංගය තිබියදීත් 2025 මාර්තු 20 වන දින රු. 1,200,000(වැට් බදු හැර) ක පිරිවැයක් සහිත පාදස්ථ මුද්‍රා තැබීමේ යන්ත්‍ර දහයක් මේස ලුණු යන්ත්‍රාගාරය සඳහා වෙනම මිලදී ගෙන තිබුණු අතර මෙම යන්ත්‍ර 2025 මැයි 28 වන දින වන විටත් භාවිතා කර නොතිබුණි. | උපස්ථයක් ලෙස කටයුතු කරයි. සමාගම විසින් සපයන ලද ඇසුරුම් යන්ත්‍රය නිසි ලෙස ක්‍රියාත්මක නොවූ අතර ප්‍රතිස්ථාපනයක් අවශ්‍ය වේ. කම්හල ක්‍රියාත්මක වන බැවින්, අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා මුද්‍රා තැබීමේ යන්ත්‍ර අත්‍යවශ්‍ය වේ. මුද්‍රා තැබීමේ යන්ත්‍ර භාවිතයෙන් අතින් ඇසුරුම් කිරීම උතුරු පළාතේ දේශීය ශ්‍රම බලකායට සැලකිය යුතු රැකියා අවස්ථා සපයන අතර, කලාපීය සංවර්ධනයට සහාය වේ. එම කරුණු මුද්‍රා තැබීමේ යන්ත්‍ර මිලදී ගැනීමට හේතු විය. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 මැයි 10 වන දින ඇමරිකානු ඩොලර් 415,000 ක කොන්ත්‍රාත් මුදලකට අලිම්ංකඩ ලුණු ලේවායේ මේස ලුණු යන්ත්‍රාගාරයක් සැපයීම, බෙදා හැරීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සමාගම සහ අක්‍රමිකතා සහ ප්‍රමාදයන් සහිත අපකීර්තිමත් ඉතිහාසයක් ඇති ඉන්දියානු සමාගමක් අතර ගිවිසුමක් ඇති කර ගෙන තිබුණි. ලංසු තැබීමේ ආකෘති පත්‍රවලට අනුව සැපයුම සහ බෙදා හැරීම දින 120 ක් ඇතුළත සිදු කළ යුතු අතර ස්ථාපනය සහ අත්හදා බැලීම් දින 78 ක් ඇතුළත අවසන් කළ යුතුය. කෙසේ වුවද, 2025 අගෝස්තු 28 දින වන විටත් කම්හල සමාගමට භාර දී නොතිබුණි. | මෙවැනි ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා සම්මත ක්‍රියා පටිපාටිවලට අනුකූලව, අවසාන පවරා ගැනීම සිදු කරනු ලබන්නේ හඳුනාගත් සියලු අඩුපාඩු සම්පූර්ණයෙන්ම නිවැරදි කර, එකඟ වූ පිරිවිතරයන්ට අනුව කම්හල ක්‍රියාත්මක වූ පසුව පමණි. මෙම ප්‍රවේශය තුළින් සංවිධානයේ දිගුකාලීන අවශ්‍යතා ආරක්ෂා කිරීම සහ කොන්ත්‍රාත්කරුගේ වගවීම සහතික කිරීම අපේක්ෂා කෙරේ.<br>ඇසුරුම්කරණ සහ මුද්‍රා තැබීමේ ගැටළු විසඳූ පසු අවසාන පවරා ගැනීම ප්‍රමාදයකින් තොරව සිදුවනු ඇත. | යන්ත්‍රාගාරය කඩිනමින් භාර දිය යුතුය. |

## 3.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් සිට 2025 මැයි දක්වා කාලය තුළ අලිමංකඩ සිට මන්නාරම දක්වා ලුණු මෙට්‍රික් ටොන් 760ක් ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද, එම කාලය තුළ ලුණු මෙට්‍රික් ටොන් 1264ක් ප්‍රවාහනය කර තිබුණු අතර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ඉක්මවා රු. 1,360,800ක මුදලක් වැය කර තිබුණි. | තරඟකාරී ටෙන්ඩර් ක්‍රියාවලියක් හරහා සැලකිය යුතු අඩුම මිලක් සහිත සහ ප්‍රතිචාරාත්මක ලෙස තෝරාගත් සැපයුම්කරුවන් යොදා ගනිමින් ලුණු ප්‍රවාහනය සිදු කරන ලදී. මෙම සැපයුම්කරුවන් කලින් අනුමත කරන ලද මිල ගණන්වලට ප්‍රවාහන සේවා සැපයීම දිගටම කරගෙන යාමට එකඟ විය. කාලය සම්බන්ධ සීමාවන් සහ හදිසි මෙහෙයුම් අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් නව ටෙන්ඩර් ක්‍රියාවලියක් ආරම්භ කිරීම කළ නොහැකි විය. | මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. |
| (ආ) | මන්නාරම ලුණු ලේවායට අනුයුක්ත කර ඇති අලෙවිකරණ සහ විකුණුම් නියෝජිතයා මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්කවල පමණක් සිදු කරන ලද විකුණුම් සඳහා කොමිස් මුදලක් ගෙවීමේ පදනම මත බඳවාගෙන තිබුණි. කෙසේ වුවද, ඔහුට ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්කවල සිදු කරන ලද විකුණුම් සඳහා කොමිස් මුදලක් ගෙවා තිබුණි. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා ඔහුට ගෙවිය යුතු මුදලට වඩා රු. 1,700,248 ක විකුණුම් කොමිස් මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | සමාගම මුලින් අලෙවිකරණ සහ විකුණුම් නියෝජිතයින් දෙදෙනෙකු පත් කළ අතර එම තනතුර මූල්‍යමය වශයෙන් වාසිදායක නොවීම මත ඔවුන්ගෙන් එක් අයෙකු සති දෙකක් ඇතුළත ඉල්ලා අස්විය. අනෙක් සේවකයාගේ කාර්ය සාධනය සතුටුදායක වූ බැවින්, සභාපතිවරයාගේ උපදෙස් මත සමාගමේ නිෂ්පාදන ධාරිතාවයට අනුගත වන පරිදි බෙදාහරින්නන් යොදවාගනිමින් අතිරේක දිස්ත්‍රික්කවලට විකුණුම් මෙහෙයුම් පුළුල් කිරීම සඳහා සාමාන්‍යාධිකාරීවරයා විසින් අනුමැතිය ලබා දෙන ලදී. ගෙවීම් ගණනය කරනු ලැබුවේ පත් කරන ලද පුද්ගලයාගේ කාර්යසාධනය මත පමණක් නොව, සමාගමට උපයාදෙන ලද ආදායම සහ ලාභය මත ය. | අලෙවි මෙහෙයුම් පුළුල් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය. |